# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2270/24 – 2022 මාර්තු 09 වැනි බදාදා – 2022.03.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 61 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/7/2019/HW/16.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KDS/TUM/4/1/6/7.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තිය (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 පෙබරවාරි මස 16 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
මිහිකත මැදුර, 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී**: ප්‍රාදේශීය ලේකම්, තුම්පනේ.

2. **ඉඩමේ විස්තරය**: මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපළාත නැගෙනහිර කෝරළයේ සුළු කොට්ඨාසයේ ගලගෙදර බටහිර (301) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මොරවද්දෙනිය (අ.ග.පි. 129 තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/TMP/2019/386 හා 2019.11.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'සී' – ඔයගාව අස්වැද්දුම – ප්‍රමාණය: හෙක්. 0.0523**

උතුරට: අ.ග.පි. 129 හි කැබලි අංක 93, 98, 72 සහ 69; නැගෙනහිරට: කැබලි අක්ෂර ඩී, සහ අ.ග.පි. 131 (ගලගෙදර); දකුණට: අ.ග.පි. 131 (ගලගෙදර) මහින්ද බණ්ඩාර සහ තවත් අය හිමිකම් කියන ඔයගාව අස්වැද්දුම; බටහිරට: කොස්පොතු ඔය, කැබලි අක්ෂර ඒ, බී සහ අ.ග.පි. 129 හි කැබලි අංක 93.

02. **කැබලි අක්ෂර 'ඩී' – අස්වැද්දුම සහ බෝගහලන්දේකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0068**

උතුරට: අ.ග.පි. 129 හි කැබලි අංක 69; නැගෙනහිරට සහ දකුණට: අ.ග.පි. 131 (ගලගෙදර); බටහිරට: අ.ග.පි. 131 (ගලගෙදර), කැබලි අක්ෂර සී සහ අ.ග.පි. 129 හි කැබලි අංක 72.

EOG 03 - 0797

1A – G 36297 – 20 (2022/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*